# මාධ්‍ය නිවේදනය

සන්නිවේදන දෙපාර්තමේන්තුව, 30, ජනාධිපති මාවත, කොළඹ 01, ශ්‍රී ලංකාව
+94 11 2477424 / +94 11 2477423 +94 11 2346257
communications@cbsl.lk / dcommunications@cbsl.lk www.cbsl.gov.lk

ශ්‍රී ලංකා මහ බැංකුව
இலங்கை மத்திய வங்கி
CENTRAL BANK OF SRI LANKA


| | |
|---|---|
| නිකුත් කළේ | සංඛ්‍යාන දෙපාර්තමේන්තුව |
| දිනය | 2021.12.15 |

## ශ්‍රී ලංකා ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය - 2021 නොවැම්බර්

### 2021 නොවැම්බර් මාසයේ දී නිෂ්පාදන සහ සේවා ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශක තවදුරටත් ඉහළ යන ලදී.

**රටේ ආර්ථික ක්‍රියාකාරකම් ක්‍රමයෙන් යථාවත් වීම හේතුකොටගෙන නිෂ්පාදන අංශයෙහි ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය තවදුරටත් ඉහළ යමින් 2021 නොවැම්බර් මාසයේදී 61.9ක අගයක් වාර්තා කරන ලදී.** නිෂ්පාදනය, නව ඇණවුම් සහ තොග මිලදී ගැනුම් උප දර්ශක වල දක්නට ලැබුණු සැලකිය යුතු ඉහළ යෑම නිෂ්පාදන අංශයෙහි ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකයේ මෙම වර්ධනය කෙරෙහි ප්‍රධාන ලෙස දායක විය.

**නිෂ්පාදන අංශයෙහි ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශක අගය**

**61.9**


**2021 ඔක්තෝබර් මාසයට සාපේක්ෂව දර්ශකාංක 1.5ක ඉහළ යෑමකි**

විශේෂයෙන් ආහාර හා පාන නිෂ්පාදන අංශයෙහි නව ඇනවුම් වල සැළකිය යුතු ඉහළ යෑමක් දක්නට ලැබුණි. එළඹෙන උත්සව සමය හේතුවෙන් පෙර මාසයට සාපේක්ෂව 2021 නොවැම්බර් මාසයේදී වැඩි ඇණවුම් ප්‍රමාණයක් ලබා ගැනීමට හැකි වූ බව මෙම අංශයේ බොහෝ ප්‍රතිචාර දැක්වූවන් සඳහන් කරන ලදී. තවද, විශේෂයෙන්ම රෙදිපිළි හා ඇඟලුම් නිෂ්පාදන අංශයෙහි නිෂ්පාදන මෙම මාසය තුළදී ඉහළ ගියේය. මෙම අංශයේ බොහෝ ප්‍රතිචාර දැක්වූවන් අවධාරණය කළේ 2021 නොවැම්බර් මාසයේදී සෘතුමය ඉල්ලුමට සරිලන පරිදි ඔවුන්ගේ නිෂ්පාදන මට්ටම් ඉහළ දැමීමට හැකි වූ බවයි. මේ අතර, සේවා නියුක්තිය පෙර මාසයට සාපේක්ෂව අඩු වේගයකින් ඉහළ යන ලදී.

| විචල්‍යය | ඔක්. | නොවැ. | +/- | සාරාංශය |
|---|---|---|---|---|
| **ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය** | **60.4** | **61.9** | **+** | **වැඩි වේගයකින් ඉහළ යෑමක්** |
| | | **උපදර්ශක** | | |
| නව ඇණවුම් | 61.7 | 67.2 | + | වැඩි වේගයකින් ඉහළ යෑමක් |
| නිෂ්පාදන | 58.2 | 64.0 | + | වැඩි වේගයකින් ඉහළ යෑමක් |
| සේවා නියුක්තිය | 57.7 | 52.7 | - | අඩු වේගයකින් ඉහළ යෑමක් |
| තොග මිලදී ගැනුම් | 56.6 | 64.0 | + | වැඩි වේගයකින් ඉහළ යෑමක් |
| ඇණවුමක් සැපයීමට සැපයුම්කරුවන්ට ගතවන කාලය | 67.3 | 58.6 | - | අඩු වේගයකින් ඉහළ යෑමක් |

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

නිෂ්පාදන අංශයෙහි ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය




මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

නව ඇණවුම් සහ නිෂ්පාදනයේ සිදුවූ වර්ධනයත් සමඟ තොග මිලදී ගැනුම් ඉහළ ගිය අතර, එළඹෙන චීන අලුත් අවුරුදු නිවාඩු හේතුවෙන් සැපයුම් අංශයේ ඇතිවිය හැකි බාධා සැළකිල්ලට ගනිමින් තොග මිලදී ගැනුම් වැඩි කළ බව රෙදිපිළි හා ඇඟලුම් නිෂ්පාදන අංශයේ සමහර ප්‍රතිචාර දැක්වූවන් අවධාරණය කළහ. මේ අතර, ඇණවුමක් සැපයීමට සැපයුම්කරුවන්ට ගතවන කාලය 2021 නොවැම්බර් මාසයේදී අඩු වේගයකින් ඉහළ යන ලදී. තවද, ආනයනික අමුද්‍රව්‍යවල පිරිවැය අඛණ්ඩව ඉහළ යෑම සැළකියුතු තත්වයක් බව සියලු උප අංශ වල බොහෝ ප්‍රතිචාර දැක්වූවන් අවධාරණය කරන ලදී.

රට තුළ මෙන්ම ගෝලීය වෙළඳපොළවල ආර්ථික කටයුතු වඩාත් සාමාන්‍යකරණය වනු ඇතැයි අපේක්ෂාවෙන් ඉදිරි මාස තුන තුළ නිෂ්පාදන කටයුතු සඳහා වන අපේක්ෂාවන් තව දුරටත් ඉහළ මට්ටමක පවතී.

### ගෝලීය ප්‍රවණතා: නිෂ්පාදන අංශයෙහි ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය

නිෂ්පාදන අංශයෙහි ගෝලීය ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය, 2021 ඔක්තෝබර් මාසයට සාපේක්ෂව 2021 නොවැම්බර් මාසයේදී දර්ශකාංක 0.1කින් පහළ යමින් 54.2ක දර්ශක අගයක් වාර්තා කරන ලදී.

පෙර මාසයට සාපේක්ෂව 2021 නොවැම්බර් මාසයේදී ඉන්දියාව, යුරෝපා කලාපය, එක්සත් රාජධානිය සහ රුසියාවේ නිෂ්පාදන අංශයෙහි ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය වැඩි වේගයකින් ඉහළ ගිය අතර, එක්සත් ජනපදයෙහි එම දර්ශක අඩු වේගයකින් ඉහළ යන ලදී. මේ අතර 2021 නොවැම්බර් මාසයේදී චීනයෙහි නිෂ්පාදන අංශයෙහි ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය පහළ යන ලදී.

*මූලාශ්‍රය: මාකිට්[1] ආයතනය, 2021 දෙසැම්බර් 14 වන දිනට*

*[1] මාකිට් යනු ලොව ප්‍රධාන පෙළේ මූල්‍ය තොරතුරු සේවා ලබාදෙන ආයතනයකි. මෙය ජාත්‍යන්තරව ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය සම්පාදනය කරන ප්‍රධාන ආයතනයක් වන අතර, එමඟින් යුරෝපා කලාපය ඇතුළුව රටවල් 30 කට අධික ප්‍රමාණයක් සඳහා ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය සම්පාදනය කරනු ලබයි.*

**සේවා අංශයෙහි ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය, 2021 නොවැම්බර් මාසයේ දී තවදුරටත් ශක්තිමත් වර්ධනයක් පෙන්නුම් කරමින්, 62.1ක දර්ශක අගයක් වාර්තා කළේය.** මෙම ඉහළ යෑම සඳහා නව ව්‍යාපාර, ව්‍යාපාර ක්‍රියාකාරකම්, සේවා නියුක්තිය සහ අපේක්ෂිත ව්‍යාපාර ක්‍රියාකාරකම් යන උප දර්ශකවල ඉහළ යෑම් හේතු විය.

ප්‍රධාන වශයෙන්, මූල්‍ය සේවා සහ ප්‍රවාහන යන උප අංශවල දක්නට ලැබුණු වර්ධනයන් සමඟ නව ව්‍යාපාර ඔක්තෝබර් මාසය හා සසඳන විට නොවැම්බර් මාසයේ දී ඉහළ ගියේය. මේ අතර, වසංගතය ආශ්‍රිත සීමා ලිහිල් කිරීම් සහ එළඹෙන උත්සව සමය සමඟ පාරිභෝගික ඉල්ලුම තවදුරටත් වැඩි වීම හේතුවෙන් ව්‍යාපාර ක්‍රියාකාරකම් අඛණ්ඩව දෙවන මාසයටත් ඉහළ ගියේය. ඒ අනුව, සියලුම උප අංශවල පාහේ ව්‍යාපාර ක්‍රියාකාරකම් වර්ධනයන් පෙන්නුම් කල අතර, මූල්‍ය සේවා, ප්‍රවාහන, තොග හා සිල්ලර වෙළඳාම සහ අනෙකුත් පෞද්ගලික සේවා යන උප අංශවල සැලකිය යුතු වර්ධනයන් දක්නට ලැබුණි. එසේ වුවද, ප්‍රතිචාර දක්වන්නන් කිහිප දෙනෙකු විසින් ආනයන සම්බන්ධ ගැටළු මධ්‍යයේ සැපයුම කෙරෙහි ඇති බාධා සහ යෙදවුම් පිරිවැය ඉහළ යෑම, සේවා අංශයේ ව්‍යාපාර ක්‍රියාකාරකම් සඳහා අඛණ්ඩව බලපෑම් ඇති කරන බව සඳහන් කරන ලදී.

ව්‍යාපාර ක්‍රියාකාරකම්වල වර්ධනයන් පිළිබඳ ඉහළ අපේක්ෂාවන්, 2021 මාර්තු මාසයෙන් පසු පළමු වරට 2021 නොවැම්බර් මාසයේ දී සේවා නියුක්තිය ඉහළ යෑමට හේතු විය. මේ අතර, කාර්යමණ්ඩල සේවකයන් සාමාන්‍ය පරිදි සේවයට වාර්තා කිරීම හේතුවෙන් නොවැම්බර් මාසයේ දී නිමකිරීමට නියමිත කාර්යයන් අඛණ්ඩව පහළ ගියේය.

| විචල්‍යය | ඔක්. | නොවැ. | +/- | සාරාංශය |
|---|---|---|---|---|
| **ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය** | **57.9** | **62.1** | **+** | **වැඩි වේගයකින් ඉහළ යෑමක්** |
| | | <u>උපදර්ශක</u> | | |
| නව ව්‍යාපාර | 58.3 | 65.7 | + | වැඩි වේගයකින් ඉහළ යෑමක් |
| ව්‍යාපාර ක්‍රියාකාරකම් | 66.2 | 71.7 | + | වැඩි වේගයකින් ඉහළ යෑමක් |
| සේවා නියුක්තිය | 45.0 | 52.0 | + | පහළ යෑමක සිට ඉහළ යෑමක් |
| නිමකිරීමට නියමිත කාර්යයන් | 49.5 | 47.3 | - | වැඩි වේගයකින් පහළ යෑමක් |
| අපේක්ෂිත ඉදිරි ව්‍යාපාර ක්‍රියාකාරකම් | 70.3 | 74.0 | + | වැඩි වේගයකින් ඉහළ යෑමක් |

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව


කොවිඩ්-19 වසංගතය ආශ්‍රිත සීමා ලිහිල් කිරීම සහ එළඹෙන උත්සව සමය මධ්‍යයේ ඉදිරි මාස තුන සඳහා ව්‍යාපාර ක්‍රියාකාරකම් පිළිබඳ සුබවාදී අපේක්ෂාවන් 2019 නොවැම්බර් මාසයෙන් පසු ඉහළම වේගයකින් වර්ධනය විය. එසේ වුවද, සමහර ප්‍රතිචාර දක්වන්නන් විසින් ඔවුන්ගේ ව්‍යාපාර කටයුතු කෙරෙහි COVID-19 නව ප්‍රභේදයෙන් ඇති විය හැකි ඍණාත්මක බලපෑම පිළිබඳව සඳහන් කරන ලදී.

**සේවා අංශයෙහි ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශක අගය**

**62.1**

**2021 ඔක්තෝබර් මාසයට සාපේක්ෂව දර්ශකාංක 4.2ක ඉහළ යෑමකි.**

සේවා අංශයෙහි
ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය




මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

## ගෝලීය ප්‍රවණතා: සේවා අංශයෙහි ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය

ගෝලීය සේවා ක්‍රියාකාරකම්හි තවදුරටත් ඉහළ යෑමක් පෙන්නුම් කරමින්, ගෝලීය සේවා අංශයෙහි ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය 2021 නොවැම්බර් මාසයේ දී 2021 ඔක්තෝබර් මාසයේ පැවති 55.6හි නොවෙනස්ව පැවතුණි.

ඇමරිකා එක්සත් ජනපදය, චීනය, ඉන්දියාව, ජපානය සහ එක්සත් රාජධානිය යන රටවල සේවා අංශයෙහි ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශක මගින් එම රටවල සේවා අංශ පසුගිය මාසයට සාපේක්ෂව 2021 නොවැම්බර් මාසයේ දී වර්ධනයක් පෙන්නුම් කළේය.

*මූලාශ්‍රය: මාකිට් [1] ආයතනය, 2021 දෙසැම්බර් 15 වන දිනට*

***තාක්ෂණික සටහන:***

**දර්ශකය**

ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය 0 සිට 100 අතර අගයන් පරාසයක විහිදී ඇත.

ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය දර්ශක ඒකක 50 ට සමාන නම් අදාළ අංශය පසුගිය මාසය හා සැසඳීමේ දී නොවෙනස්ව පැවතී ඇත.

ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය දර්ශක ඒකක 50 ට වඩා වැඩි නම් අදාළ අංශය පසුගිය මාසය හා සැසඳීමේ දී වර්ධනයක් පෙන්නුම් කරයි.

ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය දර්ශක ඒකක 50 ට වඩා අඩු නම් අදාළ අංශය පසුගිය මාසය හා සැසඳීමේ දී සංකෝචනයට ලක්වී ඇති බව පෙන්නුම් කරයි.

**නියැදිය**

මෙම සමීක්ෂණයෙහි නියැදි රාමුව සේවක අර්ථසාධක අරමුදල් දෙපාර්තමේන්තුවෙන් ලබාගන්නා ලද බස්නාහිර පළාතෙහි ස්ථානගත වී ඇති විශාල සමාගම් මත පදනම් වී ඇත. දළ දේශීය නිෂ්පාදිතයට දක්වන ආංශික දායකත්වය පදනම් කර ගනිමින් නිෂ්පාදන සහ සේවා කටයුතු සඳහා මාසිකව ප්‍රතිචාර 100 බැගින් වූ ඉලක්කයක් පවත්වාගෙන යනු ඇත.

**විචල්‍යයන්ගේ අර්ථ නිරූපණයන්**

| | |
|---|---|
| සේවා නියුක්තිය | : සමාගම සඳහා සේවය ලබාදෙන සේවකයන් ගණන |
| ගැනුම් තොගය | : නිෂ්පාදනය සඳහා යොදාගැනීමේ අරමුණින් මිල දී ගෙන ගබඩාවෙහි තබා ඇති අමු ද්‍රව්‍ය |
| ඇණවුමක් සැපයීමට සැපයුම්කරුවන්ට ගතවන කාලය | : සැපයුම්කරුවෙකුට ඇණවුමක් ලබාදීමෙන් පසු එය කර්මාන්ත ශාලාවට ලැබීමට ගතවන කාලය |
| නිමකිරීමට නියමිත කාර්යයන් | : ව්‍යාපාරික ක්‍රියාකාරකම් ඉහළයාම හේතුවෙන් නිම කිරීමට නොහැකි වූ ඇණවුම් |

අනෙකුත් විචල්‍යයන් ඒවා නම් කිරීම සඳහා යොදා ඇති වචනාර්ථයෙන්ම පැහැදිලි වේ.